# ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී)

## මධ්‍යම කාරක සභාව

මුද්‍රිත නිකුත් කිරීම

*නොවැම්බර් 25, 2011*

## පීඩිත ජනතාවගේ ආදරණීය නායකයා වූ, ඉන්දියානු විප්ලවයේ නායකයා සහ ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (මාඕවාදී) දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු වන මලෝජුලා කොටෙස්වරා රාඕ (Mallojula Koteswara Rao) කුරිරු ලෙස ඝාතනය කිරීම හෙලා දකිමු!

2011 නොවැම්බර් 24 වන දින ඉන්දියානු විප්ලවීය ඉතිහාසය තුළ ශෝචනීය දිනයක් ලෙස සනිටුහන් වනු ඇත. ''මාඕවාදීන් බරපතලම අභ්‍යන්තර ආරක්ෂක තර්ජනය යැයි'' ඝෝෂාව උලුප්පවාලූ ෆැසිස්ට්වාදී සෝනියා-මන්මෝහන්-ප්‍රනාබ්-චිදම්බරම්-ජයිරාම් රමේෂ් පාලක කල්ලිය, උතුරු බෙංගාලයේ ප්‍රධාන ඇමති මමාටා බනර්ජිගේ සහයෝගය ඇතිව සහෝදර මලෝජුලා කොටෙස්වරා රාඕ ව හොඳින් සැලසුම් කරන ලද කුමන්ත්‍රණයකට අනුව පණ පිටින් අල්ලාගෙන මරා දමන ලදි. 2010 ජූලි පළමුවන දින අපගේ පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශක වන සහොදර අෂාඩ් මරා දැමූ මේ පාලක කල්ලිය නැවත වරක් ඔවුන්ගේ දැල එළමින් ඔවුන්ගේ ලේ පිපාසාව සංසිඳුවා ගත්හ. බලයට ඒමට පෙර සහෝදර අෂාඩ් මරා දැමීම ගැන කිඹුල් කඳුලු හෙලූ මමටා බනර්ජී මගඩියක් රඟ දක්වමින් අනෙක් අතට ඉහළම ගණයේ නායකයෙකු වන සහෝදර කොටෙස්වරා රාඕ මරා දැමීම භාර ගනිමින් මෙසේ නිරුවත් ජනතා විරෝධී ෆැසිස්ට්වාදී මුහුණුවර ප්‍රදර්ශනය කළහ. උතුරු බෙංගාලයේ සහ අන්ද්‍රා ප්‍රදේශ්හි මධ්‍යම රහස් නියෝජිතයෝ සහ රහස් ඝාතක නියෝජිතයෝ හොඳින් සැලසුම් කරන ලද ක්‍රමයකට අනුව ඔහුව ලුහු බැඳ බියගුලු ක්‍රමයකට අනුව ඒකාබද්ධ මෙහෙයුමකින් මරා දමා දැන් ගොතන ලද බොරු ප්‍රචාරය කරමින් සිටී. ඇත්තටම ගැටුමින් මිය ගියේ කවුදැයි යන්න පවා නොදන්නේ යැයි බොරු ප්‍රකාශ කරන අතරෙදි මධ්‍යම ස්වදේශ කටයුතු ලේකම් R.K.සින්ග් ප්‍රකාශ කළේ මෙය මාඕවාදී ව්‍යාපාරයට බලවත් පහරක් වන බවයි. මෙලෙස මේ ඝාතනය පිටුපස සැඟවී තිබුණ ඔවුන්ගේ කුමන්ත්‍රණය ඔහු නිරුවත් ලෙස එළිදරවු කළහ. ඒකාන්තයෙන්ම පීඩිත ජනතාව, විප්ලවීය ව්‍යාපාරයේ ඉහල නායකත්වය වැනසීමෙන් මාඕවාදී ව්‍යාපාරය අතුගා දැමිය හැකියැයි සිහින දකිමින් සිටින සූරාකන පාලක පංති සහ ඔවුන්ගේ අධිරාජ්‍යවාදී හාම්පුතුන්ව මිනී වළට යවනු ඇත.

ප්‍රහ්ලාද්, රම්පි, කිෂෙන්ජි සහ බිමාල් ලෙස පක්ෂය තුළත් ජනතාව අතරත් ඉමහත් ලෙස ප්‍රකටව සිටි සහෝදර කොටෙස්වරා රාඕ ඉන්දියානු විප්ලවීය ව්‍යාපාරයේ එක් සුවිශේෂී නායකයෙකි. පසුගිය 37 වසර පුරා පීඩිත ජනතාවගේ විමුක්තිය උදෙසා සටන්වැදි අතරතුර කිසිකලෙක සිය ගිනි අවිය නිහඬ නොකරවූ, හේ තෙමේ විශ්වාස කළ මතවාදය වෙනුවෙන් සිය දිවි පුද ඇති වෙහෙස නොදැනෙන රණකාමියා 1954 දී අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයේ උතුරු තෙලන්ගානා හි කරිම්නගර් දිස්ත්‍රික්කයේ පෙද්දපාලි නගරයේ උපත ලැබූහ. නිදහස් සටන්කාමියෙකු වූ ඔහුගේ පියා වන ලාටේ වෙන්කට්ටියා සහ ප්‍රගතිශීලී මතධාරිණියක වන ඔහුගේ මව වන මධුරම්මා ගෙන් කුඩා කල සිටම කොටෙස්වරා රාඕ සිය රටට සහ පීඩිත ජනතාවට ආදරය කිරීමට පුරුදු පුහුණු වූහ. පෙද්දපාලි නගරයේ සිය උසස් පාසල් අධ්‍යාපන කටයුතුවල නිරත වන අතරතුර ඔහු ඓතිහාසික තෙලන්ගානා වෙන්වීමේ ව්‍යාපාරයට සහභාගි වූහ. ශ්‍රේෂ්ඨ නක්සල්බාරි සහ ශ්‍රීකාකුලම් ව්‍යාපාරයේ ජීවයත් සමග කරිම්නගර්හි SRR ශාස්ත්‍රාලයේ සිය උපාධි අධ්‍යයන කටයුතුවල නිරත වන අතරේදී ඔහු විප්ලවීය ව්‍යාපාරයට එක්වූහ. 1974 සිට ඔහු ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස වැඩ කිරීම ඇරඹූහ. රුදුරු හදිසි නීති කාලයේදී සමහර වෙලාවල්වල ඔහු සිරගත විය. හදිසි නීතිය අකුලාගත් පසු ඔහු සිය උපන් දිස්ත්‍රික්කය වන කරිම්නගර්හි පක්ෂ සංවිධායක ලෙස වැඩ කිරීම ඇරඹූහ. ගම්මානවලට ගොස් ගොවියන් සමග සම්බන්ධකම් දියුණු කර ගැනීම උදෙසා වූ පක්ෂයේ ආමන්ත්‍රණයක් වන ''ගම්මානවලට යන්න'' ව්‍යාපාරයට ඔහු අනුකූලතාවයක් දැක්වූහ. 1978 දී ''ජගිත්යාල් ජයිත්‍රායාත්‍රා'' (ජගිත්යාල් ජයග්‍රාහී පෙළපාලිය) ලෙස ප්‍රසිද්ධ වූ ගොවි ව්‍යාපාරයේ නැගී සිටීමේදී සුවිශේෂ භූමිකාවක් රඟ දැක්වූ එක් අයෙකි ඔහු. මේ සමගම ඔහු ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (මාක්ස් ලෙනින්වාදී), අදිලබාද්-කරිම්නගර් හවුල් කමිටුවේ දිස්ත්‍රික් කමිටු සාමාජිකයෙකු ලෙස තේරී පත්වූහ. 1979 දී කමිටුව දිස්ත්‍රික් කමිටු දෙකකට බෙදී වෙන්වන විට ඔහු කරිම්නගර් හි දිස්ත්‍රික් කමිටු ලේකම් බවට පත්වූහ. අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයේ 12 වන පක්ෂ සම්මේලනයට සහභාගි වූ ඔහු අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුවට තේරී පත්වී එහි ලේකම් ලෙස වගකීම් භාරගත්හ.



1985 දක්වා, අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටු නායකත්වයේ කොටසක් ලෙස මුළු මහත් ප්‍රාන්තය පුරා ව්‍යාපාරය විස්තීර්ණ කිරීමේදී සහ පරමාදර්ශී ලෙස ගරිල්ලා කලාප දියුණු කරමින් උතුරු තෙලන්ගානා ව්‍යාපාරය වර්ධනය කිරීමේදී ඔහු තීරණාත්මක ක්‍රියාකලාපයක් ඉටු කළහ. ව්‍යාපාරය දන්දකර්ණයා දක්වා විහිදුවාලීමෙහි සහ එය සංවර්ධනය කිරීමෙහි ලා ඔහුගේ කාර්යභාරය උත්කෘෂ්ඨය. 1986 දී ඔහුව දන්දකර්ණයා වෙත යැවුණු අතර වන කමිටුවෙහි සාමාජිකයෙකු ලෙස වගකීම් භාරගත්හ. ඔහු දන්දකර්ණයාහි ගෑඩ්චයිරෝලයි (Gadchiroli) සහ බස්තාර් (Bastar) ප්‍රදේශවල ගරිල්ලා ස්ක්වේඩයන්ට සහ ජනතාවට නායකත්වය සැපයූහ. 1993 දී ඔහුව මධ්‍යම සංවිධායක කමිටුවේ (COC) සාමාජිකයෙකු ලෙස අමතරව තෝරා ගැනුණි.

1994 සිට දිගටම, උතුරු බෙංගාලය ඇතුළුව ඉන්දියාවේ නැගෙනහිර සහ උතුරු පෙදෙස්වල විප්ලවීය ව්‍යාපාරය පැතිරවීමට සහ වර්ධනය කිරීමට ඔහු ප්‍රධාන වශයෙන්ම වැඩ කොට ඇත. නක්සල්බාරි ව්‍යාපාරයේ පරාජයෙන් පසු උතුරු බෙංගාලයේ විසිරී ගිය විප්ලවීය කොටස් එක්සත් කොට නැවත පණ ගැන්වීමෙහි ලා ඔහුගේ සුවිශේෂී ක්‍රියාකලාපය අසාමාන්‍ය විය. බෙංගාලයේ සහ විප්ලවීය කඳවුරුවල විවිධ අංශවල ජනතාව සමග ඔහු ගැඹුරින් මුහුන් වූහ, ඉමහත් ධෛර්යයෙන් යුතුව බංග්ලා භාෂාව ඉගෙන ගත් ඔහු එහි ජනතාවගේ හදවත් තුළ සද නොමැකෙන සටහනක් තබා ඇත. විප්ලවීය කණ්ඩායම් කිහිපයක් අතර එක්සත්කම සාක්ෂාත් කරගැනීම තුළ සහ පක්ෂය ශක්තිමත් කිරීමේදී ඔහු වෙහෙස නොබලා වැඩ කළහ. ආදියෙහි ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්-ලෙනින්වාදී) (මහජන යුද්ධය) 1995 දී පවත්වනු ලැබූ සමස්ත ඉන්දියා විශේෂ සම්මේලනයේදී සහෝදර කොටෙස්වරා රාඕ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස තේරී පත්වූහ. 1998 දී මහජන යුද්ධ සහ පක්ෂ සන්ධාන කණ්ඩායම් අතර සමගිය මුදුන්පමුණුවා ගැනීමට ඔහු බලවත් පරිශ්‍රමයක් දැරූහ. කලින් ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්-ලෙනින්වාදී) (මහජන යුද්ධය) 2001 දී පැවැත්වූ පක්ෂ සම්මේලනයේදී ඔහු යළිත් වරක් මධ්‍යම කාරක සභාවට සහ දේශපාලන මණ්ඩලයට තේරී පත්වූහ. ඔහු උතුරු කලාප බියුරෝවේ (NRB) ලේකම් වශයෙන් වගකීම් භාරගත් අතර බිහාර්, ජාක්හෑන්ඩ්, උතුරු බෙංගාලය, දිල්ලි, හර්යානා සහ පන්ජාබ් යන ප්‍රාන්තවල විප්ලවීය ව්‍යාපාරයන්ට නායකත්වය දුන්හ. මේවාත් සමගම ඔහු කලින් මහජන යුද්ධය සහ ඉන්දියාවේ මාඕවාදී කොමියුනිස්ට් මධ්‍යස්ථානය අතර එක්සත්වීමේ සාකච්ඡා තුළ විශේෂ කාර්යභාරයක් ඉටු කළහ. 2004 දී පක්ෂ දෙකෙහි එක්වීමෙන් පසුව එක්සත් මධ්‍යම කාරකසභාවේ සහ දේශපාලන මණ්ඩලයේ සේවහ කළහ, එසේම නැගෙනහිර කලාප බියුරෝවේ (ERB) සාමාජිකයෙකු ලෙස වැඩ කටයුතු කළහ. ඔහු ප්‍රධාන වශයෙන්ම උතුරු බෙංගාලයේ ප්‍රාන්ත ව්‍යාපාරය කෙරෙහි සිත යොමු කළ අතර දිගටම නැගෙනහිර කලාප බියුරෝවේ (ERB) මාධ්‍ය ප්‍රකාශක වූහ.

සහෝදර කොටෙස්වරා රාඕ පක්ෂයේ සඟරා පවත්වාගෙන යාමේදී සහ පක්ෂයේ අභ්‍යන්තර දේශපාලනික අධ්‍යයන ක්ෂේත්‍රයේදී විශිෂ්ඨ භූමිකාවක් රඟ දැක්වූහ. ඔහු ක්‍රාන්ති (‘Kranti’), එරජෙන්ඩා (‘Errajenda’), ජන්ග් (‘Jung’), ප්‍රභාත් (‘Prabhat’), වැන්ගාඩ් (‘Vanguard’) සහ අනෙක් පක්ෂ සඟරාවන්හි කොටස් කරුවෙක් විය. උතුරු බෙංගාලයේ විවිධ විප්ලවීය සඟරා පළ කිරීමේ සහ ඒවා පවත්වාගෙන යෑමේ සුවිශේෂී ක්‍රියා පාටිපාටියක් ඔහු සතු විය. විවිධ න්‍යායික සහ දේශපාලනික ලිපි ඔහු මේ සඟරා වලට ලියූහ. දේශපාලන අධ්‍යාපනික උප කමිටුවේ (SCOPE) සාමාජිකයෙකු වූ ඔහු පක්ෂයේ නිළයන්ට මාක්ස්-ලෙනින්-මාඕ වාදය උගැන්වීමෙහිලා සුවිශේෂී ක්‍රියාකලාපයක් ඉටු කළහ. මුළු මහත් පක්ෂ ඉතිහාසය තුළම ඔහු විප්ලවීය ව්‍යාපාරය පළල් කිරීමේදී, පක්ෂය ලිපි ලේඛණවලින් පොහොසත් කිරීමේදී සහ එය සංවර්ධනය කිරීමේදී සඳ නොමැකෙන මෙහෙයක් ඉටු කොට ඇත. 2007 ජනවාරියේදී පවත්වන ලද එක්සත් සම්මේලනයට - 9 වන පක්ෂ සම්මේලනයට සහභාගිවූ ඔහු, නැවත වරක් පක්ෂ මධ්‍යම කාරක සභාවට තේරී පත්වී දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සහ නැගෙනහිර කලාප බියුරෝවේ (ERB) සාමාජිකයෙකු ලෙස වගකීම් ලබා ගත්හ.

උතුරු බෙංගාලයේ සමාජ ෆැසිස්ට්වාදී, මාක්ස්වාදී කොමියුන්සිට් පක්ෂ (CPM) රජයේ පූර්ව-සංස්ථාපිත ජනතා විරෝධී ප්‍රතිපත්තිවලට එරෙහිව සින්ගර් (Singur) සහ නන්දිග්‍රාම් (Nandigram) ප්‍රදේශවල 2007 දී පැන නැගි, ජනතා ව්‍යාපාරයන්ට සහ විශේෂයෙන්ම කීර්තිමත් ලාල්ගාර් ජනතා කැරලිකරුවන්ගේ නැගී සිටීමට සහෝදර කොටෙස්වරා රාඕ විසින් දේශපාලන මග පෙන්වීම සපයනු ලැබුණි. මේ ව්‍යාපාරවලට නායකත්වය දීමට උතුරු බෙංගාලයේ ප්‍රාන්ත කමිටුවට සහ පක්ෂයේ නිළයන්ට ඔහු මග පෙන්වූහ, අනෙක් අතට පක්ෂයේ ප්‍රචාරක වැඩ පිළිවෙල මාධ්‍ය හරහාත් ගොන යාම ආරම්භ කොට හසුරුවා ගෙන ගියහ. 2009 වසරේදී තාවකාලික සාම සාකච්ඡා යන මැයෙන් මධ්‍යම පන්තිය මුළා කිරීමට චිදම්බරන් කල්ලිය උත්සාහ ගන්නා විට, ඔහු විශේෂයෙන්ම එය එළිදරවු කිරීමට වැඩ කළහ. බහුජනයා අතරට විප්ලවීය දේශපාලනය ගෙනයාමේදී සහ මහජන යුද්ධය ඉහළින්ම ඔසවා තැබීමේදී ඔහු දැවැන්ත වැඩ කොටසක් ඉටු කළහ. දශක හතරක් පමණ වූ මේ ශ්‍රේෂ්ඨ විප්ලවීය ගමන් මග 2011 නොවැම්බර් 24 දින හිටි අඩියේම අවසන් විය.

**ආදරණීය ජනතාවනි ! ප්‍රජාතන්ත්‍රවාදියනි !!**

මේ කුරිරු ඝාතනයට විරෝධය පළ කරන්න. මෙය පාලක පන්තිය විප්ලවීය නායකත්වය අතුගා දැමීමට සහ නිර්ධන පංති නායකත්වය සහ නිවැරදි මගපෙන්වීම ජනතාවට අහිමි කරලීමට සිදු කරන ලද කුමන්ත්‍රණයකි. රටකපුවලට ජාල් (Jal), ජංගල් (Jungle) සහ ෂමීන් (Zameen) අධිරාජ්‍යවාදී තක්කඩියන්ට විකුණා මිලියන ගණන් ස්විස් බැංකුවල තැන්පත් කරන දැවැන්ත පල් හොරුන්ට, කොම්ප්‍රදෝරුවන්ට ඇති බලවත්ම බාධකය වනුයේ මාඕවාදී ව්‍යාපාරය බව ප්‍රකට කරුණකි. පසුගිය වසර දෙක පුරාමත් බොහෝ කොටස්වල, රට පුරා විහිදී පවත්නා කොළ දඩයම් මෙහෙයුම (Operation Green Hunt) ඇත්තෙන්ම මේ අරමුණ වෙනුවෙන් ස්වය කරමින් සිටී. මේ කුරිරු ඝාතනයද එහිම කොටසකි. දේශප්‍රේමී සහ නිදහස්කාමී ජනතාවගේ කාර්යභාරය වනුයේ විප්ලවිය ව්‍යාපාරයත් එහි නායකත්වයත් සිය දෑස් මෙන් රැකගැනීමයි. එය මේ රටේ අනාගතයත්, ඉදිරි පරපුරත් ආරක්ෂා කිරීම හැර වෙන දෙයක් නොවේ.

වයස 57 දී පවා සහෝදර කොටෙස්වරා රාඕ තරුණයෙකු මෙන් දුෂ්කර ගරිල්ලා ජීවිතයෙහි රැඳී සිටි අතර ඔහු යන්නේ කොතැනද, කාඩර්වරු සහ ජනතාව අතිශය උද්‍යෝගයෙන් පිරී ඉතිරී යයි. විශේෂයෙන්ම ඔහුගේ ජීවිතය තරුණ පරපුරට ආදර්ශයක් ලෙස පවතිනු ඇත. විවේකයක් රහිතව ඔහු පැය ගණන් අධ්‍යයන කටයුතුවල සහ වැඩවල නියැලෙන්නාසේම බොහෝ දුර ගමන් කළහ. ඔහු නිඳ ගත්තේ මඳ වශයෙනි, බොහෝ වෙහෙස වී වැඩ කරන සැහැල්ලු දිවියක් ගෙවූහ. විවිධ සමාජ ස්ථරවලින් පැමිණෙන විවිධ වයස් කාණ්ඩවල මිනිසුන් සමග ඉක්මනින්ම මුහුන්වෙමින් ඔවුන්ව විප්ලවීය ජීවයෙන් පුරවාලිය. සහෝදර කොටෙස්වරා රාඕගේ දිවි පිදීම ඉන්දියානු විප්ලවීය ව්‍යාපාරයට බලවත් පාඩුවක් බවට කිසිදු සැකයක් නැත. නමුත් අපේ රටේ ජනතාව අතිශයින් ශ්‍රේෂ්ඨ වන්නාහ. ජනතා ව්‍යාපාරයෝ සහ ජනතාව කොටෙස්වරා රාඕ වැනි නිර්භීත, පරිත්‍යාගශීලී විප්ලවවාදීන්ට උපත ලබා දෙති. ජගිත්යල් (Jagityal) සිට ජංගල් මහල් (Jungle Mahal) දක්වා, කොටෙස්වරා රාඕගේ විප්ලවීය ජීවය උරාගෙන තිබෙන කම්කරුවෝ, ගොවියෝ සහ විප්ලවවාදීහු මේ රට පුරා ඔහු විහිදුවාලූ විප්ව්ය සුවඳ සමග අව් අතට ගෙන ඒකාන්තයෙන්ම ඉන්දීය නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය විජයග්‍රාහී මාවත වෙතට ගෙන යනු ඇත. ඔවුහු අධිරාජ්‍යවාදීන් සහ ඔවුන්ට ගැතිකම් කරන ඉඩම්හිමි සහ කොම්ප්‍රදෝරු නිළධාරිවාදී ධනපති නියෝජිතයින් වන සෝනියා, මන්මෝහන්, චිදම්බරන් සහ මමටා බනර්ජී වැනියවුන් අතුගා දමනු ඇත.

සහෝදර කොටෙස්වරා රාඕ කෲර ලෙස ඝාතනය කිරීමට එරෙහිව විරෝධය දැක්වීමක් ලෙස නොවැම්බර් 29 සිට දෙසැම්බර් 5 දක්වා විරෝධතා සතියක් පවත්වන ලෙස සහ දෙසැම්බර් 4-5 දිනයන්හි පැය 48 ක හර්තාලයක් (‘Bharat Bandh’ m) දියත් කරන ලෙසට අපේ මධ්‍යම කාරක සභාව රටේ පුරවැසියන්ට ආයාචනා කර

සිටී. මේ ඝාතනයට විරෝධය දැක්වීමට රැස්වීම් රැලි, හර්තාල පැවැත්වීම, කළු පැහැති සංකේත පැළඳීම, මාර්ග අවහිර කිරීම වැනි විවිධ වැඩසටහන් දියත් කරන ලෙස අපි ආයාචනා කර සිටිමු. දෙසැම්බර් 4-5 යන දිනයන්හි පැවැත්වෙන හර්තාලයේ කොටසක් ලෙස දුම්රිය, මාර්ග, වාණිජ සහ අධ්‍යාපනික ආයතන වසා දමන ලෙසත්, සියලුම විධියේ වෙළඳ ගනු දෙනු නවතා දමන ලෙසත් අපි ඉල්ලා සිටිමු. කෙසේ වෙතත්, අපි වෛද්‍ය සේවාවන් හර්තාලයෙන් නිදහස් කර තබමු.



**(අබේ)**
**මාධ්‍ය ප්‍රකාශක,**
**මධ්‍යම කාරක සභාව,**
**ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී), CPI(Maoist)**

පරිවර්තනයකි
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
T #18

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com